# දායක මුදල් විස්තර වාර්තාව

සාමාජිකයාගේ සේවක අර්ථසාධක අරමුදල් (සේ.අ.අ.) ගිණුමට දායක මුදල් බැර වී ඇති කාල පරිච්ඡේද සහ එම කාල පරිච්ඡේද සඳහා බැර වී ඇති දායක මුදල දායක මුදල් විස්තර වාර්තාවෙහි සඳහන් වේ.

## දායක මුදල් විස්තර වාර්තාවක් ඉල්ලුම් කළ හැකි අවස්ථා

සාමාජිකයෙකුට පහත අරමුණු සඳහා දායක මුදල් විස්තර වාර්තාවක් ඉල්ලුම් කළ හැකිය.

- වීසා ලබා ගැනීමේ දී දායකත්වය හෝ නිපුණතාව තක්සේරු කිරීම සඳහා
- ජාතික වෘත්තීය සුදුසුකම් සඳහා (NVQ)
- සේවායෝජකයා විසින් සේ.අ.අ. දායක මුදල් නිවැරදිව ප්‍රේෂණය කර ඇත්ද යන්න තහවුරු කර ගැනීම සඳහා

දායක මුදල් විස්තර වාර්තාව ඉල්ලුම් කරනු ලබන අරමුණ අනුව ලේඛන හඳුනාගැනීමේ සහ පරිශීලනයේ පහසුව සඳහා දායක මුදල් විස්තර වාර්තාව මුද්‍රණය කිරීමට භාවිතා කරන කඩදාසි වෙනස් වේ.

## දායක මුදල් විස්තර වාර්තාව ඉල්ලුම් කළ හැකි ආකාර

සේ.අ.අ. සාමාජිකයෙකුට පහත ආකාර ඔස්සේ දායක මුදල් විස්තර වාර්තාවක් ඉල්ලුම් කළ හැකිය.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට පැමිණ ඉල්ලීම් කිරීම මගින්
- අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, වයිටවේස් ගොඩනැගිල්ල, අංක 25, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ-01 යන ලිපිනයට යොමු කරනු ලබන ලිපියක් මගින්
- epfconhis@cbsl.lk යන විද්‍යුත් තැපැල වෙත ඊ-මේල් (email) පණිවිඩයක් යොමු කිරීම මගින්

## දායක මුදල් විස්තර වාර්තාව ඉල්ලුම් කිරීමේදී සාමාජිකයා විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන

1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද දායක මුදල් විස්තර වාර්තා/ව ඉල්ලුම් කිරීමේ අයදුම් පත්‍රය **"දායක මුදල් විස්තර වාර්තාව සඳහා ඉල්ලුම්පත්‍රය"** [*Link*]
2. ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපත
3. 'බී' කාඩ්පතෙහි පිටපත/පිටපත්
4. වීසා ලබා ගැනීමේ දී දායකත්වය හෝ නිපුණතාව තක්සේරු කිරීමේ අරමුණ සඳහා දායක මුදල් විස්තර වාර්තා/ව ඉල්ලුම් කරන විට විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුවෙහි පිටපත

## වැදගත් උපදෙස්

- සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව කේවල සාමාජික ගිණුම් තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට බැඳී සිටින බැවින් දායක මුදල් විස්තර වාර්තාව අදාළ සාමාජිකයාට පමණක් නිකුත් කරනු ලබයි.

- විද්‍යුත් තැපැල හරහා දායක මුදල් විස්තර වාර්තාව ඉල්ලුම් කරන විට, එම ඉල්ලීම සාමාජිකයාගේ පුද්ගලික විද්‍යුත් තැපැල හරහා පමණක් යොමු කළ යුතු ය.

- වීසා ලබා ගැනීමේ අවශ්‍යතාව / නිපුණතා තක්සේරුව සඳහා දායක මුදල් විස්තර ඉල්ලුම් කරන විට වලංගු විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුවෙහි පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

- දායක මුදල් විස්තර වාර්තාවක් ලබා ගැනීම සඳහා බී’ කාඩ්පතෙහි පිටපතක් ඉදිරිපත් කිරීම හෝ ‘බී’ කාඩ්පත් තොරතුරු කම්කරු දෙපාර්තමේන්තු දත්ත පද්ධතියෙහි ඇතුළත් වී තිබීම අනිවාර්ය වේ.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි භාවිත පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් සාමාජික නම, ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නමට වඩා වෙනස් වූ විට දායක මුදල් විස්තර වාර්තාවක් නිකුත් නොකෙරේ.